// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2137/26 - 2019 අගෝස්තු මස 20 වැනි අඟහරුවාදා - 2019.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 4 වන සංශෝධනය

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාව

2010 සැප්තැම්බර් මස 10 දිනැති හා අංක 1670/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2012 නොවැම්බර් මස 09 දිනැති හා අංක 1783/37 දරන සහ 2013 ජුනි මස 28 දිනැති අංක 1816/32 දරන සහ 2016 නොවැම්බර් මස 11 දිනැති හා 1992/77 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර මගින් සංශෝධිත ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලබන අතර මෙම සංශෝධිත විධිවිධානයන් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2019 පෙබරවාරි මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 අගෝස්තු මස 07 වැනි දින,

10.1.1.1

(i) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබීම.

(vi) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.2.1.1

(i) සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබීම.

(iv) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.2.1.1 යටතේ සඳහන් සුදුසුකම්වලට පහළින් පහත සටහන ඇතුළත් කරනු ලැබේ.

*සටහන*

අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2019 පෙබරවාරි මස 26 වැනි දිනට II ශ්‍රේණියට උසස්වීමට නියමිත සංශෝධිත 10.1.1.1 හී සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සහ එදිනට පෙර II ශ්‍රේණියට උසස්වී ඇති නිලධාරීන්, III හා II ශ්‍රේණිවල වසර 12ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහ 10.2.1.1 (i) හී සඳහන් සුදුසුකම හැර 10.2.1.1 යටතේ සඳහන් අනෙකුත් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

09 - 51

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.